# සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව
# சமுர்த்தி அபிவிருத்தி திணைக்களம்
# Department of Samurdhi Development

මුදල් අමාත්‍යාංශය
සමෘද්ධි , ගෘහ ආර්ථික , ක්ෂුද්‍ර මූල්‍ය , ස්වයං රැකියා හා ව්‍යාපාර සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය
நிதி அமைச்சு
சமுர்த்தி, வதிவிடப் பொருளாதார,நுண்நிதிய, சுயதொழில்,மற்றும் வியாபார அபிவிருத்தி இராஜாங்க அமைச்சு
Ministry of Finance
State Ministry of Samurdhi, Household Economy, Micro Finance, Self Employment and Business Development


| මගේ අංකය<br>எனது இல<br>My No | DSD/HO/10/IA/CC/පොදු | ඔබේ අංකය<br>உமது இல<br>Your No | .................................. | දිනය<br>திகதி<br>Date | 2021.06.16 |
|---|---|---|---|---|---|

දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂ මගින්,

දිස්ත්‍රික් කණ්ඩායම් නායක .................................. දිස්ත්‍රික්කය.

**ප්‍රාදේශීය විගණන ඒකක (Audit units) පිහිටුවීම හා නවක සංවර්ධන නිලධාරීන් රාජකාරී සඳහා අනුයුක්ත කිරීම.**

උක්ත කරුණ මැයෙන් මාගේ අංක DSD/HO/10/IA/CC/පොදු හා 2021.04.20 දිනැති ලිපිය හා සමාංක 2021.05.03 හා 2021.05.24 දිනැති ලිපි වෙත ඔබගේ අවධානය යොමු කරවමි.

02. දෙපාර්තමේන්තුවේ පුලුල් විෂය පථය හා කාර්ය භාර්ය තවදුරටත් පුලුල් වීම යනාදී කරුණු පදනම් කරගෙන විගණන ඒකක පිහිටුවීම හා විගණන නිලධාරීන් හා උපාධිධාරී සංවර්ධන නිලධාරීන් අනුයුක්ත කිරීම සිදු කරන ලදී. එසේ වුවද ඒ ඒ දිස්ත්‍රික්ක සඳහා උපාධිධාරී සංවර්ධන නිලධාරීන් අනුයුක්ත කිරීම සමහර දිස්ත්‍රික්ක සඳහා අපේක්ෂිත ප්‍රමාණයට වඩා වැඩියෙනුත් තවත් දිස්ත්‍රික්ක වලට අඩුවෙනුත් සිදුව ඇත.

03. සමාන පදනමකින් එක් එක් විගණන ඒකකයට රාජකාරී බෙදා හැරීමට කටයුතු කලද ඉහත නිලධාරීන් එක් එක් දිස්ත්‍රික්කයට අනුයුක්ත කිරීමේ විෂමතාවය හේතුවෙන් පරිපාලන වශයෙන්ද දුෂ්කරතා මතුව ඇත.

04. ඉහත තත්වය සැලකිල්ලට ගෙන එක් එක් විගණන ඒකකයට අනුයුක්ත (විගණන අංශය සඳහා) නිලධාරීන් ගණන පිලිබඳ සමාලෝචනය කර නිෂ්චිත ක්‍රමවේදයක් මත නිලධාරීන් විගණන අංශයේ රාජකාරී සඳහා යෙදවීමටත්, අතිරික්ත නිලධාරීන් බැංකු මූල්‍ය, අලෙවි, ජීවනෝපාය අංශ වෙත යෙදවීමටත් අධ්‍යක්ෂ ජනරාල්තුමා දන්වා ඇත.

05. ඒ අනුව එක් විගණන ඒකකයක් සඳහා ඇති ප්‍රජාමූල බැංකු, සමිති, ප්‍රාදේශීය ලේකම් කාර්යාල ප්‍රමාණය 13 ක් හෝ ඊට අඩුනම් සංවර්ධන නිලධාරීන් තිදෙනෙකුත්, 13 ට වැඩිනම් හතර දෙනෙකුත් හා දුෂ්කර ප්‍රදේශ වලට අයත් විගණන ඒකකයන් සඳහා පමණක් තවත් එක් අමතර නිලධාරියෙකු


1වන අදියර,4 වන මහල, සෙත්සිරිපාය, බත්තරමුල්ල. /1ம் கட்டம், 4 வது மாடி,செத்சிறிபாய பத்தரமுல்ல /1st Step, 4 th floor, Sethsiripaya Battar

| | අධ්‍යක්ෂ ජනරාල්<br>பணிப்பாளர் தலைமையதிபதி<br>Director General | අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (පාලන හා ආයතන)<br>மேலதிக பணிப்பாளர் தலைமையதிபதி ( நிர்வாகம்/தாபனம்)<br>Additional Director General (Admin & Establishment) | ප්‍රධාන ගණකාධිකාරී<br>பிரதான கணக்காளர்<br>Chief Accountant | අධ්‍යක්ෂ (ක්ෂුද්‍ර මූල්‍ය)<br>பணிப்பாளர் (குறு நிதி )<br>Director ( Micro Finance) | කාර්යාලය<br>அலுவலகம்<br>Office |
|---|---|---|---|---|---|
| Tel- | 011-2872202 | 011-2873799 | 011-2869742 | 011-2889003 | 0112872202 |
| Fax - | 011-2889002 | 011-2873996 | 011-2869742 | 011-2887469 | |
| E-mail- | dg@samurdhi.gov.lk | diradmin@samurdhi.gov.lk | finance@samurdhi.gov.lk | | |
| | | Hot Line :0112-889007 | | Hot Line:0112-885582 | Hot Line: 011- |

ලෙස **උපරිම වශයෙන්** සේවයේ යොදවාගත හැක. ඊට අමතරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ කණ්ඩායම් නායක හට විගණන හා අනෙකුත් රාජකාරි වෙනුවෙන් **උපරිම වශයෙන්** සංවර්ධන නිළධාරීන් දිස්ත්‍රික්කයේ විගණන ඒකක ගණන 5ක් හෝ ඊට අඩුනම් දෙදෙනෙකුත්, 6ත් 10ත් අතර නම් තිදෙනෙකුත් හා 11 හෝ ඊට වැඩිනම් සිව්දෙනෙක් වශයෙන් දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ අභ්‍යන්තර විගණන අංශයට අනුයුක්ත කල හැක. ඒ අනුව දක්වා ඇති **උපරිමයන්ට යටත්ව** නිලධාරීන් දිස්ත්‍රික්කය තුල විගණන ඒකක අතර හෝ ආසන්න දිස්ත්‍රික්ක වල විගණන ඒකක අතර සුදුසු පරිදි තුලනය කිරීමට කටයුතු කල යුතුය.

06. ඒ අනුව වෙනත් අංශ වෙත අනුයුක්ත කිරීමට යෝජිත නිලධාරීන්ගේ ලැයිස්තුව සකස් කර සතියක් ඇතුලත මා වෙත ලැබීමට සලස්වන ලෙසත් කාරුණිකව දන්වමි. අභ්‍යන්තර විගණන අංශයේ රාජකාරී සාර්ථක කර ගැනීම සඳහා ඔබගෙන් ලැබෙන සහයෝගය අගය කරමි.

ආර්.පී.පී. අබේකෝන්,
ප්‍රධාන අභ්‍යන්තර විගණක,
අධ්‍යක්ෂ ජනරාල් වෙනුවට.

පිටපත් :

01. ලේකම් - සමෘද්ධි, ගෘහ ආර්ථික, ක්ෂුද්‍ර මූල්‍ය ස්වයං රැකියා හා ව්‍යාපාර සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය - (කා.දැ.පි)

02. සියළුම ස්ථාන භාර නිලධාරීන් ........................... දිස්ත්‍රික්කය - (අ.ක.ස)

03. සියළුම අංශ ප්‍රධානීන් - (දැ.ගැපි)

04. විගණකාධිපති -(දැ.ගැපි)